# බළන්ගොඩ නගර සභාව

## 2022-04-06 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.04.06**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රුමී මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රි | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රිනී | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රි | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 16. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මයා

**01. පසුගිය සභාවේ 2022-03-08 දිනැති මහා සභා වාර්තාව හා 2022-03-03 දිනැති විශේෂ මහ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2022-03-08 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-03-03 දින පැවති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා, 2022-03-08 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-03-03 දින පැවති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවන්හි සංශෝධනයන් තිබේදැයි විමසීය.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා 2022-03-08 දින පැවති මහ සභාවේ (පිටු අංක 02) නගර සභාවක් විසින් ලබා දෙන කඩ කාමරයක ගිවිසුම් කඩ කළ විට ගන්නා ක්‍රියාමාර්ගය පිළිබඳව පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් විමසූ නමුත් එතුමා පිළිතුරු ලබා දී ඇත්තේ සභාවේ ගත් තීරණ කිහිපයක් පිළිබඳව බව ද තමන් විමසූයේ සභාවේ ගත් ක්‍රියාමාර්ග සම්බන්ධව නොවන බව ද සභාවේ කඩ කාමරයක ගිවිසුම් කඩ කල විට ගන්නා වූ ක්‍රියාමාර්ග ගැන නැවත වරක් දැනුවත් කරන ලෙස ඉල්ලා සිටින බව ද පැවසීය.

එමෙන්ම 2022-03-08 දින පැවති මහ සභාවේ (පිටු අංක 08) හිටපු ගරු ආණ්ඩුකාරතුමා වන ධම්ම දසනායක මැතිතුමා විසින් සෞඛ්‍ය අතුරු ව්‍යවස්ථාවක් සම්මත කරගත් අතර, එහි සීඩී පටයක් පමණක් ලැබුණු බැවින් පිටපතක් ලබා දෙන ලෙස ඉල්ලූ බව ද එම සෞඛ්‍ය අතුරු ව්‍යවස්ථාව සබරගමුව පළාතටම බලපාන පරිදි සකස් කර ඇති අතර, එය වැළඳගත් බැවින් ඒ අනුව ක්‍රියාත්මක විය යුතු නමුත් එය ක්‍රියාත්මක නොවන බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා 2022-03-08 දින පැවති මහ සභාවේ (පිටු අංක 05 හා 06) "ස්වයං රැකියාවක් වශයෙන් මල් පෝච්චි සහ පැල වෙළඳාම සිදු කර ගෙන යාම" සම්බන්ධව සාකච්ඡාවේ දී එහි නම් සඳහන් අය වෙත බදු පදනම මත ලබා දීමට සියලු දෙනාම තීරණය කළ නමුත් එය ඇතුලත්ව නොමැති බැවින් එය සංශෝධනය විය යුතු බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ඉදිරිපත් කළ සංශෝධනය සම්බන්ධව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් ගුවන් පාලම යට කඩ කාමරයක් ඉදි කිරීම සම්බන්ධව

ටෙන්ඩරයකට යා යුතු බවට සභාවේ තීරණයක් ලැබුණු පසු මෙම ස්ථානය ද ටෙන්ඩරයකට යා යුතු බවට අදහස් ලැබුණු නමුත් යෝජනා ස්ථිරත්වයක් වූවා දැයි ගැටලුවක් ඇති බව පවසන ලදී.

ගරු උප සභාපති එම්. ටී.එම්. රූමි මැතිතුමා පැවසූවේ පැමිණිලි හා සංදේශ යටතේ ඉදිරිපත් වූ ලිපියක් බැවින් සභාවේ සම්මත වීම සඳහා න්‍යාය පත්‍රයට ඇතුලත් වී යෝජනාවක් වශයෙන් සම්මත විය යුතු බවයි.

මෙහි දී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙම ස්ථානය ලබා දෙන ලෙස ලිපි ලැබෙන බැවින් නීත්‍යානුකූලව භූමියේ අයිතිය පිළිබඳව සොයා බලා තීරණයකට පැමිණීම සුදුසු බව පවසන ලදී.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව 2022-03-08 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-03-03, පැවති විශේෂ මහ සභා වාර්තා ගරු සභාවේ සම්මත විය.**

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. ප්‍රේමදාස මැතිතුමා පෙ.ව 10.12 ට පමණ සභාවට පැමිණෙන ලදී.**
**ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය පෙ.ව 10.12 ට පමණ සභාවට පැමිණෙන ලදී.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ගරු සභාපතිතුමා විසින් නිවේදන වාරය ආරම්භ කරමින් ප්‍රකාශ කළේ ප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන් ගරු නාගරික මන්ත්‍රීවරුන් සඳහා වෙන් කර ඇති මිලියන 17 ක ප්‍රතිපාදනවලින් අවශ්‍ය සංවර්ධන කටයුතු කඩිනමින් සිදු කර ගන්නා ලෙසයි.

- අසනීප තත්ත්වයක් හේතුවෙන් 2022-04-06 දින මහ සභාවට සහභාගී නොවන බවත්, නිවාඩු අනුමත කර දෙන ලෙසත්, ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් කරන ලද ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදුව නිවාඩු අනුමත කරන ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- රට තුළ පවතින ඉන්ධන හිඟය හේතුවෙන් 2022-02-26 දින සිට බස් රථ ධාවනය සම්පූර්ණයෙන්ම අඩාල වූ බැවින් 2022 වර්ෂය සඳහා ගිවිසගත් මුදල ගෙවීමට නොහැකි බවත්, සාධාරණ මුදලක් අය කරන ලෙසත්, බස් රථ නිසියාකාරව ධාවනය වන තුරු සාධාරණ විසඳුමක් ලබා දෙන ලෙසත් පවසමින් බස් රථ නැවතීමේ ගාස්තු අය කිරීමේ ටෙන්ඩර්කරු වන බළන්ගොඩ, ඇල්ලෙපොල, එම්.උදයශාන්ත යන අය විසින් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගගත කරන ලදී.

  මේ සම්බන්ධව අදහස් දක්වූ ගරු සභාපතිතුමා පැවසූවේ මෙම කාල සීමාවන් තුළ බස් රථ ධාවනය පිළිබඳව වාර්තාවක් ලබා ගෙන සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවයි.

- බළන්ගොඩ නගරයට පිවිසෙන ස්ථානයේ අංක 333, ගල්පොත්ත අරාව නැමැති වගුරු බිම සංවර්ධනය කර දෙන ලෙස මෙම ඉඩමේ අයිතිකරුවන් විසින් කරන ලද ඉල්ලීම අනුව සභා සම්මත කිරීමෙන් අනතුරුව ගොවිජන සේවා දෙපාර්තමේන්තුව දැනුවත් කර අවසරය ලබා ගෙන මෙම කාර්යය ඉටු කර

ගන්නා ලෙස සම්බන්ධීකරණ කමිටුවේ දී තීරණය වී ඇති බව ද ඒ අනුව සභා සම්මත කිරීමට නැවතත් සභාවට ඉදිරිපත් කරන බව ද පවසමින් ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, මේ සඳහා වසර දෙකකට පෙර සභාවේ අනුමැතිය ලබා ගෙන සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කළ පසු අනුමැතිය ලැබුණු නමුත් සභා වාර්තාවට නැවත මෙය ඇතුලත් කර ගැනීම සඳහා ඉදිරිපත් කළ බව ද පර්චස් 33 ක් හා අයිතිකරුවන් 14 දෙනෙකු සිටින බව ද පැවසීය.

- 2016 වසරේ නාය ගිය බැංකියවත්ත කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ අපද්‍රව්‍ය හේතුවෙන් කුඹුරු ඉඩම සම්පූර්ණයෙන්ම අවහිර වී ඇති බවත්, අදාල නිළධාරීන් හට මේ සම්බන්ධව කිහිපවරක් දැනුම් දුන් නමුත් ප්‍රතිඵලයක් නොලැබුණු බවත්, සුදුසු යන්ත්‍රයක් යොදා නැවත ඇළ කපා ජලය නිසි පරිදි ගලා යාමට සලසා වගා කටයුතු කිරීමට ඉඩ සලසා දෙන ලෙසත් ඉල්ලමින් බැංකියවත්ත, එපිටපැත්ත කුඹුරු ඉඩම් හිමියන් විසින් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ මෙම අයගේ ඉල්ලීම ඉටු කරලීම සඳහා බළන්ගොඩ නගර සභාවේ ජේසීබී ස්කැවේටරය යොදා ඇළ සකස් කර දීම සුදුසු බවයි.

- පළතුරු ජංගම අලෙවි සේවා ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා මොහාන් සාලිය එල්ලාවල මාවතේ ඇති යකඩ බඩු ව්‍යාපාර ස්ථානයට යාබදව ඇති බිම් කොටස ලබා දෙන ලෙසත්, නගර සභාවේ සැලසුමට අනුව තම මුදලින් කඩය නිම කර, මාසිකව රු.25,000.00 ක මුදලක් නගර සභාවට ගෙවන බවත් පවසමින් බළන්ගොඩ, කිරිඳිගල, සන්ධ්‍යා නිවස ලිපිනයේ පදිංචි ටී.ඒ. මධූෂි ලක්වානි යන අය විසින් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

- පරිගණක අලෙවි සේවා ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බස්නැවතුම්පලේ ගුවන් පාලම යට ඇති ජයවීර හෝටලයට යාබදව ඇති බිම් කොටස ලබා දෙන ලෙසත්, නගර සභාවේ සැලසුමට අනුව තම මුදලින් කඩය නිම කර, මාසිකව රු.35,000.00 ක මුදලක් නගර සභාවට ගෙවන බවත් පවසමින් බළන්ගොඩ, හුණුකුඹුර පාර, 146/5 ලිපිනයේ පදිංචි එස්. සදීෂ් කුමාර යන අය විසින් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මෙම ලිපි දෙක සම්බන්ධයෙන් පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා නීත්‍යානුකූලව භූමියේ අයිතිය බලා පළාත් පාලන කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් යොමු කර ඇති ලිපියට අනුව කටයුතු කිරීම හෝ වෙනත් යෝජනා පවතින්නේ නම් එම යෝජනා සභා සම්මත කර පළාත් පාලන කොමසාරිස් හරහා ගරු ආණ්ඩුකාරතුමාට යොමු කළ හැකි බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභාවේ උප කාර්යාලයක් මෙම ස්ථානයේ ස්ථාපිත කිරීමට ආසියානු පදනම සමඟ සැලසුම් සකස් කළ බව ද එමඟින් මහජනයාට සේවා සැපයීමේ පහසුවක් ඇති වන බව ද වාණිජමය වශයෙන්ම නොබලා

ආයතනයට වටිනාකමක් ඇතිවන පරිදි සේවාවන් සැපයීම කෙරෙහි උත්සාහයක් ගැනීම වඩාත් සුදුසු බව ද පැවසීය.

මේ සම්බන්ධව අදහස් දක්‌ වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, මෙම ස්ථානයෙහි පැන්තාලියක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් වසර ගණනාවක සිට කරන ලද ඉල්ලීම අනුව අවසර ලැබුණ නමුත් ප්‍රතිපාදන නොමැති නිසා ප්‍රමාද වූ බව ද වර්තමානයේ පවතින තත්ත්වය අනුව එහි කටයුතු තාවකාලිකව නවතන බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා අදහස් දක්වමින් ටෙන්ඩර් කරන ලෙස දන්වා ඇත්නම් හැකි ඉක්මනින් එය ඉටු කරන ලෙසට යෝජනා කරන බව පැවසීය.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් මෙම බිම් කොටස නගර සභාවට අයත් බැවින් එහි ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් කරන ලෙස දන්වා ඇතත් නාගරික සංවර්ධන අධිකාරිය මෙය ඔවුනට අයත් යැයි පවසන බව ද මේ නිසා භූමියේ අයිතිය නිරවුල් කර ගැනීම පළමුව ඉටු කර ගත යුතු බව ද පවසන ලදී.

- පැරණි වෙළඳසැල පිටුපස එළවළු වෙළඳාම් කර සිටි නමුත් නව පොදු වෙළඳසැලේ වෙළඳාම් කිරීමට සුදුසු ස්ථානයක් නොලැබුණු බව ද දැනට ඉරිදා දින පමණක් වෙළඳාම් කරගෙන යන අතර, දිනපතා වෙළඳාම් කරගෙන යාම සඳහා නගර සභාවට අයත් ඉරිදා පොළේ ඇති මුර කුටිය කුලිය අය කරගෙන ලබා දෙන ලෙස ඉල්ලමින් බළන්ගොඩ, හුණුකුඹුර, අංක 305 ලිපිනයේ පදිංචි ඒ.එම්. ධර්මකීර්ති යන අය විසින් ඉදිරිපත් කළ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

- මේ දිනවල දිවයින පුරා සිදු කරන විදුලිය විසන්ධි කිරීම හේතුවෙන් දෛනික වෙළඳාම 90% කින් පමණ පහත වැටී ඇති බවත්, රටේ උද්ගතව ඇති ආර්ථික අවපාතය සහ විශේෂයෙන් විදුලිය විසන්ධි වීම හේතුවෙන් ඇති වී තිබෙන තත්ත්වය සලකා බලා විදුලිය විසන්ධි වන මාස වෙනුවෙන් කඩ කුලී අය නොකර සහන සලසා දෙන ලෙස බළන්ගොඩ, බස් නැවතුම්පළ, සරණ ව්‍යාපාරික සංසදය විසින් ඉදිරිපත් කළ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

04:01 පරිගණක 05ක් මිල දී ගැනීම වෙනුවෙන් මිල ගණන් විවෘත කිරීම

මිල ගණන් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ මිල ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව Base hp (Pvt) Ltd ආයතනයෙන් පමණක් මිල ගණන් ලැබී තිබූ අතර, එක් HP 280 G8 Desktop පරිගණකයක් රු. 217,300.00 ක් බැගින් හා BHP 700 UPS එකක් රු. 10,700.00 ක් බැගින් මිල ගණන් ඉදිරිපත් කර ඇති බව ද ඩොලර් අර්බුදය නිසා වර්තමාන වෙළඳපොළ තුල පවතින මිල ගණන් ඉහළ යාම හේතුවෙන් මෙම මිල ගණන් යටතේ පරිගණක මිල දී ගැනීමෙන් සභාවට විශාල පාඩුවක් සිදුවන නිසා මෙම තත්ත්වය යථා තත්ත්වයට පත් වූ පසු නැවත පරිගණක 05ක් මිල දී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05. කල් දී ඇති ප්‍රශ්න**

**05:01 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා**

05:01:01 මන්ත්‍රී ප්‍රතිපාදනවලින් මා හට ලැබෙන මුදලින් පූජනීය ස්ථානවලට භාණ්ඩ බෙදා දීමට ඉල්ලීමක් කර ඇත. එම ඉල්ලීම කිරීමට හැකි ද? නොහැකි ද? යන්න විස්තරාත්මකව ලබා දෙන්න.

මේ සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, මුදල් අමාත්‍යාංශය විසින් 2021-08-28 දිනැතිව රාජ්‍ය වියදම් සමාලෝචනය සම්බන්ධව එවා ඇති ලිපියෙහි මූලධන සංවර්ධන වැඩසටහන් යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදන භාවිතයෙන් සිදු කරනු ලබන විවිධ ද්‍රව්‍ය, භාණ්ඩ හා උපකරණ බෙදාදීම් සහ සහනදායී බැංකු ණය/ආධාර නොවන මූල්‍ය ප්‍රදාන ලෙස ලබා දෙනු ලබන ආධාර සමාලෝචනය කර ඒවා අත්හිටුවන ලෙස දන්වා ඇති බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් මෙම ලිපිය ලැබීමට පෙර ගරු සභාපතිතුමා විසින් මන්ත්‍රීවරුන් සඳහා වෙන් කරන ලද මුදල්වලින් සංවර්ධනය සඳහා මුදලක් වැය කිරීමටත්, ඉතිරි මුදල්වලින් සමිති සමාගම් සඳහා යම් භාණ්ඩ ප්‍රමාණයක් ලබා දීමටත් හැකි බව පැවසූ බව සඳහන් කළේය. ඒ අනුව තමන් වෙත පූජනීය ස්ථාන හා සමිති කිහිපයකින් අවශ්‍ය පුටු,බඟල් ආදී උපකරණ ඉල්ලා ලිපි ලැබී ඇති බව ද මිළ ගණන් කැඳවා ඇති බව ද සියලුම කටයුතු සූදානම් කර පවතින අවස්ථාවේ දී මෙම චක්‍රලේඛය ලැබුණු බැවින් ගරු මන්ත්‍රීවරුන් වශයෙන් අපහසුතාවට පත්වන බව ද මේ සම්බන්ධව නිසි පිළිතුරක් ලබා දෙන ලෙස ද පවසන ලදී.

05:01:02 යහ සාධක සංගමයේ මුදල් වියදම් කරන ආකාරය සහ ගිණුමේ කොපමණ මුදලක් තිබේ ද?
ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් යහසාධක සංගමයේ මුදල් වියදම් සම්බන්ධව එම සංගමයේ සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික වෙතින් විමසිය යුතු අතර, සභාවෙන් විමසීම නොකළ යුතු බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් යහසාධක සංගමය සුභ සාධක සංගමයක් වන අතර, විගණනයක් ලක් නොවන බව ද සභාවේ කිසිදු මැදිහත්වීමකින් තොරව කම්කරුවාගේ සිට ඉහළ නිලධාරීන් දක්වා සියලුම දෙනාගේ තීරණ ක්‍රියාත්මක කරන

බව ද මෙම සංගමය ඒ.ඒ.එල් ප්‍රනාන්දු මැතිතුමා 1995 දී ත්‍යාග වශයෙන් ලැබුණු රු. 10,000.00 ක මුදල ගිණුමකට තැන්පත් කිරීමෙන් ආරම්භ වූ අතර, තමන් ද ත්‍යාග වශයෙන් ලැබුණු ලක්ෂ 10-15 ක් එම ගිණුමෙහි තැන්පත් කළ බව ද එම කාලයේ රු.10,000.00 ක් 4% පොළියට ණය වශයෙන් ලබා දුන් අතර, එය අද වන විට ලක්ෂය දක්වා වර්ධනය වී ඇති බව ද මෙහි මුදල් සම්බන්ධව නිරන්තරයෙන්ම තමන් විමසූ නමුත් කිසි දිනක එය නොපැවසූ බව ද මරණයක දී නිළධාරීන්ට හා සේවකයන්ට ලබා දෙන මුදලෙහි පරතරය නැති කිරීම සඳහා පොදුවේ සියලුම දෙනාට රු. 50,000.00 ක මුදලක් ලබා දීමට තමන් පැවසූ අතර, එදින සිට එම මුදල ලබා දුන් බව ද සභාවේ ගරු මන්ත්‍රීවරුන් සංගමයේ සාමාජිකයන් කර ගන්නා ලෙස තමන් පැවසූ බව ද ඒ අනුව ඔවුනට ද රු. 50,000.00 ක මුදල ලබා දුන් නමුත් කිසිවෙකු ස්තුති නොකළ බව ද මාස 03 කට වරක් හෝ අවුරුද්දකට වරක් හෝ සංගමය රැස් විය යුතු බව ද පවසන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා, මෙම සංගමයේ මුදල් කොපමණ තිබේදැයි විමසන ලදී.

මේ සම්බන්ධව යහසාධක සංගමයේ ලේකම්ගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව යහසාධක සංගමයේ ගිණුමේ රු. 355,673.17 ක් ද ණය ගිණුමෙහි රු. 20,079.69 ක් පවතින බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**05:02 ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය**

05:02:01 බුද්ධ ජයන්ති මාවතේ ජල ටැංකිය අසල ඉඩම් කට්ටි අනුමත කිරීමේ දී පොදු පහසුකම් සඳහා වෙන් කර ඇති ඉඩම් කැබැල්ල කුමක් ද?

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් මෙම ඉඩම වැවේකුඹුරහේන හෙවත් වැවේවත්ත බව ද කැබලි අංකය 62 බව ද පැවසීය.

05:02:02 එහි විශාලත්වය කොපමණ ද? රූඩ් 01 පර්චස් 36.3

05:02:03 එහි අයිතිය නිරවුල්ව සභාව සතුව පවතී ද? ඔව් (ඔප්පුවක් මගින් ලබා දී ඇත)

05:02:04 මුගුණමලය සුසාන භූමිය පවරා ගැනීමේ වර්තමාන තත්ත්වය කුමක්ද? මිනින්දෝරු කාර්යාලය වෙත මුදල් ගෙවා සේවය ලබා දෙන ලෙස ලිපි නිකුත් කර ඇත.

05:02:05 සංරක්ෂිත කලාප තුල අවම බිම් ප්‍රමාණය පිළිබඳ යොමු කරන ලද ප්‍රශ්නයේ ප්‍රගතිය කුමක් ද? සංරක්ෂිත කලාපය තුල අවම බිම් ප්‍රමාණය පර්චස් 12 ක් වන අතර, ඒ බව ගොඩනැගිලි අයදුම්පත්‍රය සමඟ ලබා දෙන උපදෙස් පත්‍රිකාවේ සඳහන් කර ඇත.

05:02:06 සංරක්ෂිත කලාප තුල ඉදිකිරීම් කටයුතුවල දී ජනතාව දැනුවත් කිරීම සඳහා සභාවේ යෝජනා වූ පරිදි දැන්වීම් යොදා ඇත් ද? දැන්වීම් යොදා නැති නමුත් උපදෙස් පත්‍රිකාවේ සඳහන් කර ඇත.

05:02:07 මොහාන් සාලිය එල්ලාවල මාර්ගයේ සංරක්ෂිත කලාප තුල ඉදි කර ඇති කඩ කාමර සඳහා වරිපනම් බදු අය කර ඇත්තේ නේවාසික ද? ව්‍යාපාරික ද? පොදුවේ සියලුම ව්‍යාපාරික ස්ථාන සඳහා 5% ක් අය කරනු ලබයි.

**05:03 ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

05:03:01 කාන්තාව, සාමය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ කමිටුවක් පිහිටුවන ලදී. එය පළාත් සභාව හරහා දැනුවත් කිරීමක් අනුව කරන ලද්දකි. එහි ප්‍රගතිය හා විස්තර සම්බන්ධයෙන් දැනුවත් කරන්න.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ සහ පළාත් පාලන දෙපාරතමේන්තුව මගින් දන්වා එවන ලද සංයුතියෙන් 2021.10.29 වන දින බළන්ගොඩ නගර සභාවේදි ළමා හා කාන්තා ආරක්ෂණ කමිටුව පිහිටුවන ලද අතර, එහිදී බහුතරයේ අදහස වූයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාන්තා නිළධාරී, පරිවාස නිළධාරී යන නිළධාරීන්ගෙන් හා සෑම ආයතනයකම නිළධාරීන්ගෙන් සමන්විත සාර්ථක කමිටුවක් මාස 3කට වරක් පැවැත්වීම හා එම කමිටුවම ශක්තිමත් කිරීම සුදුසු වන බව ද පවසන ලදී.

05:03:02 කාන්තාව, සාමය හා ආරක්ෂාව සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් පළාත් පාලනය තුල ස්ථාපනය කළ හැකි ද? ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීම සඳහා පළාත් පාලන නියෝජිතවරයෙකු ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් කාන්තා සංවිධානය එකතු වී අතුරු ව්‍යවස්ථාවක් සකස් කර, ගරු සභාවට ලබා දෙන ලෙසත්, සභාවේ එය අනුමත කර ඉදිරි කටයුතු සඳහා යොමු කළ හැකි බවත් පවසන ලදී.

**05:04 ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය**

05:04:01 දොරවෙල ඔය කෝපිවත්ත යා කෙරෙන මාර්ගය සුද්ධ පවිත්‍ර කර දෙන මෙන් ඉල්ලීම් කළ ද මේ වන තෙක් ඉටු වී නොමැත. මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් ගම්වාසීන්ට ලබා දීමට සුදුසු පිළිතුර කවරේ ද?

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් පවතින සේවක හිඟය හා අත්‍යවශ්‍ය කර්මාන්ත ඉටු කිරීම සඳහා අවධානය යොමු කර ඇති බැවින් දොරවෙල ඔය කෝපිවත්ත යා කෙරෙන මාර්ගය සුද්ධ පවිත්‍ර කිරීමට නොහැකි වූ අතර, ඉදිරියේදී එය ඉටු කිරීමට මේ වන විට සැලැසුම් කර ඇති බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් තමන් විසින් අද දින සභාවට ඉදිරිපත් කිරීම සඳහා ලබා දුන් "අවතැන් වූ පවුල් සඳහා තාවකාලික නිවාස ලබා දීමට කරන ලද ඉල්ලීමට ගත් තීරණය කුමක් ද?" යන කල් දී ඇති ප්‍රශ්නය ඇතුලත් කර නොමැති බව ද එය ඇතුලත් නොකිරීමට හේතුව කුමක් දැයි විමසූ අතර, අසරණ පවුල් 04 ක් සිටින බව ද ඔවුන් සඳහා කිරිමැටිතැන්න අලාබ්දීන් මාවතේ පවතින බිම් කැබැල්ලෙහි තාවකාලික කාමර ඉදි කර දීමට හැකි නම් හොඳ බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුවේ පොළ භූමියේ පවුල් කීපයක් ජීවත්වන අතර, ඔවුනට නගර සභාවට අයත් ඉඩම් කීපයෙන් එකක් ලබා දීමෙන් අනවශ්‍ය ප්‍රශ්න ඇති විය හැකි බවයි.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් තමන් නීතිඥවරුන් සඳහා කාමර කීපයක් ලබා දී තිබුණු අතර, පසුගිය දිනක පුද්ගලයන් දෙදෙනෙකු එම කාමර සඳහා ඇතුල් වී මුදල් ආදිය සොරකම් කර තිබුණු බව ද එම අය පොළ භූමියේ සිටින අය බැවින් එවැනි පුද්ගලයන් වෙනත් ස්ථානයක තාවකාලිකව හෝ පදිංචි කිරීම භයානක බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් මොහුන් හට නිවහනක් ලබා දීමට තිබේ නම් හොඳ බව ද ඉඩමක් ලබා දෙන්නේ නම් ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙකු නිවසක් සාදා දීමට කැමති වී ඇති බව ද මෙම ස්ථානයේ දරුවන් දෙදෙනෙකු ෆුට්බෝල් ක්‍රීඩාවේ දක්ෂතමයන් වී ඇති බව ද පැවසීය.

මෙහි දී අදහස් දැක් වූ ගරු උප සභාපතිතුමා, කිරිමැටිතැන්න අලාබ්දීන් මාවතේ ඉඩමක් ඉල්ලූ නමුත් එය බැවුම් සහිත ඉඩමක් බව ද නගර සභාවට යම් කිසි මුදලක් ගෙවා භාරකාර මණ්ඩලයෙන් දීර්ඝකාලීන බද්දකට ඉල්ලා තිබූ නමුත් එම කාලයේ එය ඉටු කර ගැනීමට නොහැකි වූ බව ද මෙම ඉඩම ආශ්‍රිතව රජයේ සේවකයන් සහ වෙළඳ ප්‍රජාව ජීවත් වන අතර, පන්සල හා පල්ලිය ආසන්නවම පවතින බව ද බීමත්ව හැසිරෙන පුද්ගලයන් නොමැති බව ද එබැවින් මෙවැනි පුද්ගලයන් එහි පදිංචි කිරීම ගැටලුවක් වන බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් ගරු හිටපු සභාපති විමලසේන වැවේගෙදර මැතිතුමා මෙම ඉඩම පවරාගත් අතර, අධික බෑවුම නිසා එහි කිසිදු කටයුත්තක් සිදු කිරීමට නොහැකි බව ද පොළ ස්ථානයේ සිටින පවුල් සඳහා නගරය ආසන්නයෙන් තාවකාලිකව ස්ථානයක් ලබා දීම සුදුසු බව ද විශේෂයෙන් පාසල් යන දරුවන් සිටින බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් පදික කඩ ඉවත් කිරීම සඳහා කඩ ඉදි කර ලබා දුන්න ද පදික කඩ ඉවත් නොවූ බැවින් මෙම පුද්ගලයන්ට නිවාස ලබා දුන් පසු තව පිරිසක් මේ ආකාරයට ජීවත් විය හැකි බව ද එවැනි ගැටලු සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු බවද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් නගරයේ පිරිසිදු කරනු ලබන අය පොළෙහි සිටින අතර, ඔවුන් සමඟ නිවාස නොමැති වෙනත් කණ්ඩායමක් සිටින බව ද දෛනිකව කසළ එකතු කරන අය තෝරාගෙන බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය ආශ්‍රිතව ප්‍රයෝජනයට ගත නොහැකි කෙළවරක තාවකාලික නිවාස පේළියක් වැසිකිළියක් සමඟ ඇති කර ලබා දිය හැකි බව ද තමන් පදික කඩ ඇති වීමට නොදී උපරිමයෙන් නගරය ආරක්ෂා කර ගත් නමුත් ගරු සභාපතිතුමා විසින් ඡන්ද පදනම ඇති කර ගැනීම සඳහා බුලත්ගම මිනිසුන් නගරයට ගෙනවිත් පදික කඩ ඇති කර ඇති අතර, නගරය අද පොළක් බවට පත්ව ඇති බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් පැවසුවේ තමන් සභාපති වශයෙන් පත්වීමට පෙර සිටම පදික කඩ තිබූ අතර, තමන් ඡන්ද පදනම වෙනුවෙන් කිසිවෙකු නගරයට ගෙන නොආ බවයි.

## 06. කල් දී ඇති යෝජනා

### 06:01 ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා

06:01:01 බළන්ගොඩ නගර සභාවේ අංශ ප්‍රධාන කමිටුවේ දී තීරණය කර ගත් පරිදි සභාවට අලාභයක් සිදු නොවන ලෙස සේවා පවත්වා ගෙන යාමේ අරමුණින් පවතින වෙළඳපොල තත්ත්වයන් යටතේ මිල ගණන් සංශෝධනය කළ අතර, 2022-03-17 දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාල සේවාවන් නව මිල ගණන් යටතේ ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

| **සේවාව** | **පවතින මිල** | **යෝජිත මිල** |
|---|---|---|
| ජල බවුසරය කුලියට ලබා දීම | | |
| • පානීය ජල බවුසරයක් | රු.3,000.00 | රු.4,000.00 |
| • පානීය නොවන ජල බවුසරයක් | රු.2,750.00 | රු.3,750.00 |
| • ස්ථනයේ නතර කර තැබීම දිනකට | රු.2,000.00 | රු.4,000.00 |
| • සංවර්ධන කටයුතු වලදී ජලය ඉසීම හෝ අමතර ජල බවුසරයකට | රු.1,000.00 | රු.1,500.00 |
| • නගර සභා සීමාවෙන් පිට වැඩිවන සෑම කිලෝමීටරයකටම රු.250.00 (Up and Down එකතුව) ලෙස අයකිරීම | | |
| JCB යන්ත්‍රය කුලියට ලබා දීම (යන්ත්‍ර පැයකට ක්‍රියාකරු සමඟ) | රු.2,600.00 | රු.4,000.00 |
| ලෙලෙන තලනය කුලියට ලබා දීම | | |
| • ටොන් 01 පැය 08ක සේවා දින භාගයක් සඳහා | රු.3,000.00 | රු.4,000.00 |
| • ටොන් 10 යන්ත්‍ර පැය 01ක් සඳහා ක්‍රියාකරු හා ඉන්ධන සමඟ (පැය 01 ක් සඳහා) | රු.3,325.00 | රු.4,325.00 |

| | | |
|---|---|---|
| මෝටර් ග්‍රේඩරය කුලියට ලබා දීම (පැයකට රියදුරු හා ඉන්ධන සමඟ) | රු.2,850.00 | රු.4,500.00 |
| ගලි සේවාව (ලීටර 2500)<br>• නගර සීමාවේ නිවාස/ ආගමික ස්ථාන/පුණ්‍ය ස්ථාන/පාසල් හා රජයේ ස්ථාන<br>• නගර සීමාවේ ව්‍යාපාරික ස්ථාන සඳහා<br>• නගර සීමාවෙන් පිටත නිවාස/ ආගමික ස්ථාන/පුණ්‍ය ස්ථාන/පාසල් හා රජයේ ස්ථාන<br>• නගර සීමාවෙන් පිටත ව්‍යාපාරික ස්ථාන සඳහා<br>• නගර සීමාවෙන් පිටත වැඩිවන සෑම කිලෝ මීටර් එකක් සඳහා(Up and Down එකතුව ලෙස අයකිරීම) | රු.5,250.00<br>රු.6,250.00<br>රු.9,000.00<br>රු.9,500.00<br>රු. 200.00 | රු.6,250.00<br>රු.7,500.00<br>රු.10,000.00<br>රු.10,500.00<br>රු. 250.00 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:02 බළන්ගොඩ, රාස්සගල, 7 කණුව ලිපිනයේ පදිංචි ටී.ජී. චන්න විමුක්ති ජයවීර යන අයට බළන්ගොඩ නගර සභා උද්‍යානයේ පෝනියෙක් පැදවීම සඳහා ලබා දීම, මිල ගණන් තීරණය කිරීම හා ඒ වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් සබරගමුව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් CLG/AD/2/8/3 හා 2020-11-02 දිනැති ලිපිය මඟින් බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ විනෝද බදු පැනවීම හා ගාස්තු අය කර ගැනීම සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බවට දැනුම් දී ඇති අතර, එහි සඳහන් කරුණු සභාවට ඉදිරිපත් කරන ලදී.

මේ සම්බන්ධව ඇති වූ සාකච්ඡාවෙන් අනතුරුව බළන්ගොඩ නගර සභා උද්‍යානයේ පෝනියෙක් පැදවීම සඳහා ටී.ජී. චන්න විමුක්ති ජයවීර යන අයට අවසර ලබා දීමටත්, ඒ සඳහා කොන්දේසි ප්‍රකාරව ගිවිසුම්ගතව මාසිකව රු. 15,000.00 බැගින් අය කර ගැනීම සුදුසු බවටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:03 ක්‍රිස්තෝදු බදුගේ ඉනෝකා සංජීවනී යන අයට අයත් බළන්ගොඩ ඉම්පීරියල් ඉදිරිපිට අංක 09 කඩ කාමරය අභිමානී ශ්‍යාමන්තිකා නානායක්කාර යන අයට පවරා දීමට කැමැත්ත පළ කර ඇති අතර, කඩ කුලී නාම ලේඛනයේ අභිමානී ශ්‍යාමන්තිකා නානායක්කාර ලෙස නම වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:04 නව මහජන පොළෙහි ඇති කඩ කාමර 16 හි දොරවල් සවි කර ගන්නා බවත්, තමන්ටම එම කඩ කාමර ලබා දෙන ලෙසත් එහි වෙළඳාම් කටයුතුවල නිරත වෙළඳුන් විසින් ඉල්ලා ඇති අතර, එම කඩ කාමරවල දොරවල් සවි කර ගැනීමට හා දැනට සිටින වෙළඳුන්හටම වෙළඳාම් කරගෙන යාමට ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් නව බස්නැවතුම්පළ සිට නව මහජන පොළ දක්වා විකල්ප මාර්ගයක් සකස් කර දිය යුතු අතර,එසේ නොමැති වුවහොත් එම කඩ සඳහා පාරිභෝගිකයින් අඩුවෙන් පැමිණිය හැකි බව ද වෙළඳාම සිදු වීම හෝ නොවීම කෙසේ සිදු වුව ද එහි වෙළඳාම් කරන වෙළඳුන්හටම දොරවල් සවි කර ගැනීමට අවසර ලබා දීම සුදුසු බව ද පවසන ලදී.

මේ සම්බන්ධව පැවති සාකච්ඡාවෙන් අනතුරුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව දීර්ඝකාලයක් තිස්සේ නව මහජන පොළෙහි කඩ කාමර 16 ක ඉරිදා පොළ දිනයේ වෙළඳාම් කටයුතුවල නිරත වන වෙළඳුන්හට එම කඩ කාමර 16 හි දොරවල් සවි කර ගැනීමට ලබා දීම සුදුසු බවට ද දීර්ඝකාලීනව බදු පදනම මත මාසික කුලිය අය කර ගනිමින් එම වෙළඳුන්හටම කඩ කාමර 16 ලබා දීම සුදුසු බවට ද ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:05 පුස්තකාල සහායිකා තනතුර සඳහා ලැබී ඇති අයදුම්පත්‍ර නාම ලේඛනය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ අදහස වූයේ ගරු සභාපතිතුමා විසින් සුදුසු අයකු පුස්තකාල සහායිකා තනතුර සඳහා බඳවා ගන්නා ලෙසත්, ඒ පිළිබඳව විරෝධයක් නොමැති බවත්ය.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුගේම අදහස වූයේ ගරු සභාපතිතුමා විසින් සුදුසු අයකු බඳවා ගැනීම සිදු කරන ලෙසයි.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් තමන් අවුරුදු 27 ක් පමණ සභාව නියෝජනය කළ නමුත් කිසිවකු රැකියාවකට යොදවා නැති බව ද ගරු නාගරික මන්ත්‍රීවරුන්ගේ අදහස වෙනුවෙන් තම ගෞරවය පිරිනමන බව ද පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:06 බැංකියවත්ත කොම්පෝස්ට් අංගනයේ සිදු වූ නාය යාම හේතුවෙන් වගා කිරීමට නොහැකි වූ කුඹුර හා ඇල මාර්ගය නැවත වගා කිරීමට හැකි ආකාරයකට සකස් කර දීම සඳහා සභාවේ කැණීම් යන්ත්‍රය (Jcb Excavator) ලබා දීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:07 "අයවැය යෝජනා 2022 - ගම සමග පිළිසඳරක්" ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ පහත මාර්ගවල ජල නල එළීම සඳහා කාණු කැපීමට මෙන්ම අදාල කාර්යය වෙනුවෙන් සභාවේ කැණීම් යන්ත්‍රය (Jcb Excavator) ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය වෙත ලබා දීමට සභා අනුමැතිය ලබා ගැනීම

- උඩ ඇල්ලෙපොල පල්ලෙකුඹුර පාර - මීටර 360
- පුපුලවත්ත පිරිවෙන පාර - මීටර 500
- කුමාරගම අලුත්වත්ත පාර - මීටර 300
- කුමාරගම කීනගහඇල්ල පාර - මීටර 500

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය පැවසුවේ විනිවිදභාවයෙන් යුතුව සිදු කළ යුතු බැවින් වැඩ අධිකාරීතුමාගෙන් දළ ඇස්තමේන්තුවක් ලබාගෙන අවශ්‍ය කාර්යය ඉටු කරන ලෙසයි.

මේ සම්බන්ධව සභාවේ දීර්ඝ සාකච්ඡාවක් ඇති විය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:08 බළන්ගොඩ නගර සභාව සතු පොදු වෙළඳසැල අංක 17 දරණ කුකුල් මස් කඩ කාමරයේ ගිවිසුම් කාලය 2022 ජූලි 27 වන දින අවසන් වන බැවින් එම කුකුල් මස් කඩ කාමරය ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම හා අවම ලංසු මුදල තීරණය කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව පැවති සාකච්ඡාවෙන් අනතුරුව ගරු සභාපතිතුමන් විසින් බළන්ගොඩ නගර සභාව සතු පොදු වෙළඳසැල අංක 17 දරණ කුකුල් මස් කඩ කාමරය ටෙන්ඩර් කිරීමටත් අවම ලංසු මුදල වශයෙන් රු. 33,000.00 ක මුදල සුදුසු බවටත් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:09 රථ වාහන ටෙන්ඩර්ය සම්බන්ධයෙන් වන ගාස්තුවලින් 2022 වර්ෂයේ පහත නිවාඩු දිනයන් වෙනුවෙන් සහනයක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- 2022 අප්‍රේල් මාසයේ 13 වන දින සිට 17 වන දින දක්වා
- 2022 මැයි මාසයේ 3, 15 හා 16 යන දිනයන්
- 2022 ජූනි මාසයේ 14 වන දින
- 2022 ජූලි මාසයේ 10 හා 13 යන දිනයන්
- 2022 අගෝස්තු මාසයේ 11 වන දින
- 2022 සැප්තැම්බර් මාසයේ 10 වන දින
- 2022 ඔක්තෝම්බර් මාසයේ 09 හා 24 යන දිනයන්
- 2022 නොවැම්බර් මාසයේ 07 වන දින
- 2022 දෙසැම්බර් මාසයේ 07 හා 25 යන දිනයන්

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙහි දී 2022 වර්ෂයේ අප්‍රේල් මස 13 වන දින සිට 17 වන දින දක්වා ද, නත්තල් දිනය වන දෙසැම්බර් මස 25 වන දින හා සෑම මසකම පෝය දිනයන් රථ වාහන ටෙන්ඩර්ය සම්බන්ධයෙන් වන ගාස්තුවලින් නිදහස් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:10 බළන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටිය සංගීත ප්‍රසංග සඳහා ලබා දීමේ දී දැනට අය කරනු ලබන මුදල ප්‍රමාණවත් නොවන බවට නිරීක්ෂණය වන බැවින් 25% ක විනෝද බද්දක් අය කිරීම හා ක්‍රීඩා පිටිය සඳහා වන ගාස්තු අය කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වූ ගරු සභාපතිතුමා මෑත කාලයේ දී සංගීත ප්‍රසංග දෙකකට බළන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටිය ලබා දුන් අතර, ඉන් එක් ප්‍රසංගයක් අවලංගු වූ නමුත් නගර සභාවේ තැන්පත් කළ මුදල නැවත ලබා නොගත් බව ද ඔවුන්ට යම් පාඩුවක් සිදු වූ බැවින් අද ලබා ගන්නා තීරණය ඔවුනට වලංගු නොවන පරිදි ගන්නා ලෙස ද පසුගිය සංගීත ප්‍රසංගය මඟින් නගර සභාවට ලබා ගැනීමට හැකිව තිබූ විශාල මුදලක් අහිමි වූ බැවින් අවලංගු වූ සංගීත ප්‍රසංගය හැර ඉදිරියට පැවැත්වෙන සියලු සංගීත ප්‍රසංග සඳහා 25% ක විනෝද බද්දක් අය කිරීම සුදුසු බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් පසුගිය පැවති සංගීත ප්‍රසංගයේ දී ඇතැම් ගරු මන්ත්‍රීවරුන් සඳහා පොල්තෙල් පහන දැල්වීමට පවා ආරාධනා නොකළ බව ද එසේ වූයේ නිවැරදි දේ වෙනුවෙන් පෙනී සිටි නිසා බව ද ක්‍රීඩා පිටියට වාහන ඇතුල් කිරීමට විරුද්ධ බව ද එදින ඇති වූ ටයර් සලකුණු තවමත් පවතින අතර, තැන්පත් මුදලක් ලබා ගත් නමුත් එම සලකුණු බොහෝ කාලයක් යනතුරු නොමැකෙන බව ද පැවසීය. එම නිසා සභාවට ආදායමක් ලැබෙන බැවින් පිට්ටනිය තුලට කිසිසේත්ම වාහන ඇතුල් කිරීමට ඉඩ නොදී වගකීමක් සහිතව සංගීත ප්‍රසංග සඳහා ලබා දීමේ ගැටලුවක් නොමැති අතර, එසේ නොමැති නම් සංගීත ප්‍රසංග සඳහා ලබා නොදීම වඩාත් සුදුසු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් සංගීත ප්‍රසංග සඳහා ලබා දීම සම්බන්ධව විරෝධයක් නොමැති නමුත් පිට්ටනිය ආරක්ෂා විය යුතු බැවින් වාහන ඇතුල් කිරීමට ඉඩ නොදිය යුතු බව පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:11 කසළ එකතු කිරීමේ කාර්යයේ නියැලි සිටින දෛනික කම්කරුවන්ගේ දීමනාව වැඩි කිරීම සඳහා ටෙන්ඩර් ගාස්තු වැඩි කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසුවේ පවතින ජීවන වියදම ඉහළ යාම හේතුවෙන් දෛනික කම්කරුවන්ගේ දීමනාව රු. 1,500.00 දක්වා වැඩි කර ඊට අදාලව ටෙන්ඩර් ගාස්තු වැඩි කරන ලෙස කසළ ටෙන්ඩර්කරු විසින් ඉල්ලා ඇති අතර, 2021 දෙසැම්බර් දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු වාර්තාව අනුව නුපුහුණු කම්කරුවෙකු සඳහා දෛනික දීමනාව රු. 1,350.00 ක් ලෙස මිල නියම කර ඇති බවයි.

එමෙන්ම ගිවිසුම අනුව ටෙන්ඩර් මුදල වැඩි කිරීම සභාවට කළ නොහැකි බවත් ඒ සඳහා අනුමැතිය ලබා ගත යුතු බවත් ලේකම්තුමා විසින් පෙන්වා දී ඇති අතර, පවතින ටෙන්ඩර් මුදල අනුව කම්කරු දීමනා වැඩි කර සේවාව පවත්වාගෙන යාමට සභා තීරණයක් ලබා ගෙන ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගත යුතු බව ගරු සභාපතිතුමා පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් කසළ ටෙන්ඩරය සඳහා සභාවෙන් මුදල් ගෙවන බැවින් අවම ටෙන්ඩර් මුදල ඉදිරිපත් කර ඇති ටෙන්ඩර්කරුට කසළ ටෙන්ඩරය ලබා දුන් බවත්, එම මුදලට වඩා වැඩියෙන් ටෙන්ඩර් මුදල් ඉදිරිපත් කළ අය සිටි බවත්, එම නිසා සභාවෙන් තීරණයක් ගන්නේ කෙසේදැයි විමසීය.
ගරු සභාපතිතුමා, මෙය සුවිශේෂී අවස්ථාවක් බව ද ටෙන්ඩර්කරු ඉවත් කර සභාවෙන් කසළ එකතු කිරීම ආරම්භ කළහොත් නුපුහුණු කම්කරුවෙකු සඳහා දෛනික දීමනාව රු.1,350.00 ක් වශයෙන් ගෙවීමට සිදු වන බව ද එබැවින් ටෙන්ඩර්කරුට කම්කරු දීමනාව රු. 1,100.00 ක් ගෙවන ලෙස පැවසීම අසාධාරණ බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් සභාවෙන් මෙම කාර්යය ඉටු කිරීමේ දී රු.1,350.00 ක් දෛනික කම්කරු දීමනාව ගෙවන්නේ නම් ටෙන්ඩර්කරු වෙත එම මුදල ලබා දීමේ ගැටලුවක් නොමැති බව පැවසීය.

ඒ අනුව වර්තමානයේ පවතින තත්ත්වය පිළිබඳව සානුකම්පිතව සලකා බලා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව 2022 අප්‍රේල් 01 සිට ක්‍රියාත්මක වන පරිදි නුපුහුණු කම්කරුවෙකු සඳහා දෛනික දීමනාව රු. 1,350.00 ක් දක්වා වැඩි කිරීම සඳහා ගිවිසුම්ගත ටෙන්ඩර් මුදල රු. 719,999.00 ක් දක්වා වැඩි කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:12 බළන්ගොඩ දිසා අධිකරණයේ නඩු අංක 65499 දරණ නඩුව සමථයකට පත් කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පසුගිය අප්‍රේල් 01 වන දින මෙම නඩුව පැවති අතර, එහි දී මෙම නඩුව නිසා විත්තිකාර පාර්ශවය අසරණ වී ඇති බවත්, එය ඔවුන්ට හිරිහැරයක් හා අපරාධයක් වී ඇති බවත් පැවසූ බව ද දෙපාර්ශයේම නීතිඥයන් සමඟ සාකච්ඡා කළ අතර, රාජකාරියට බාධා කළා යැයි නඩුවක් ගොනු කිරීම බරපතල බව ද මොවුන් බැංකියවත්ත නාය යාම නිසා බලපෑමකට ලක් වූ පිරිසක් බැවින් හා දැනටත් බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය අවට ජීවත්වන බැවින් නඩුව සමථයකට පත් කර ගන්නේ නම් සභාවේ යෝජනාවක් සම්මත කරගෙන එය උසාවියට ඉදිරිපත් කළ යුතු බව ද විත්තිකාර

පාර්ශවය විසින් නැවත නගර සභාවට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ගයක් නොගන්නා බවට දිවුරුම් ප්‍රකාශයක් ලබා දිය යුතු බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් මෙම නඩුව ඉල්ලා අස් කර ගැනීම සඳහා තීන්දු කරන්නේ දෙවන පාර්ශවය විසින් වුව ද මෙය පොලීසිය විසින් නිළධාරීන් වෙනුවෙන් කරන ලද පැමිණිල්ලක් බැවින් පැමිණිලි පාර්ශවයේ කැමැත්ත අවශ්‍ය නැත්දැයි විමසන ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් පැවසුවේ සභාව විසින් නඩුව සම්බන්ධව තීරණය කළ ද නැවත උසාවියේ දී අදාල පාර්ශවයන් විසින් සාක්ෂි ලබා දිය යුතු බවයි.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් විත්තිකාර පාර්ශවය සමථයකට පත්වීම සඳහා ඉල්ලීමක් කළ යුතු අතර, මෙම නඩුව පවත්වා ගෙන යාම වෙනුවෙන් නීතිඥ ගාස්තු සඳහා සභාව විසින් දරන ලද වියදම අය කර ගත යුතු බව ද නඩුව සමථයකට පත් කරගැනීම සඳහා සභාව ඉල්ලීමක් කළහොත් නැවත වරක් එම අයට නගර සභාවට විරුද්ධව කටයුතු කළ හැකි බැවින් දිවුරුම් පෙත්සමක් ලබා ගත යුතු බව ද සීතාවක නගර සභාව මඟින් අනවසර ඉදිකිරීමක් සම්බන්ධව පැවති නඩුව අනවසර ඉදිකිරීම පවතිද්දීම ඉල්ලා අස් කර ගැනීම නිසා වැරදි පූර්වාදර්ශයක් වූ බව ද පවසන ලදී.

ඒ අනුව බලන්ගොඩ දිසා අධිකරණයේ නඩු අංක 65499 දරණ නඩුව හේතුවෙන් අසරණ වී ඇති පුද්ගලයන් සම්බන්ධව සානුකම්පිතව සලකා බලා එම නඩුව සමථයකට පත් කර ගැනීමටත්, නැවත නගර සභාවට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ගයක් නොගන්නා බවට දිවුරුම් ප්‍රකාශයක් ලබා ගැනීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:13 බස්නැවතුම්පළ හා සතිපොළ පොදු වැසිකිළිය පවිත්‍ර කිරීම හා නඩත්තු කටයුතු සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් මතුව ඇති අතර, ඒ සම්බන්ධව තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බස්නැවතුම්පළ හා සතිපොළ පොදු වැසිකිළි ගාස්තු අය කිරීම රු.10.00 ක් වුව ද රු. 20.00 ක් අය කරන බව ද සනීපාරක්ෂාව, පිරිසිදුකම ඉතාම පහළ තත්ත්වයේ පවතින බව ද හිටපු ගරු සභාපතිතුමා පවා මේ සම්බන්ධව වාචිකව මෙන්ම ලිඛිතව අදාල ටෙන්ඩර්කරු වෙත අවවාදයන් සිදු කළ නමුත් දිගින් දිගටම ගිවිසුම් අවලංගු වන බව ද මෙම නිසා ටෙන්ඩරය අහෝසි කර නැවත ටෙන්ඩර් කරන තුරු සභාවෙන් කිරීමට සිදු වන බව

ද ගිවිසුම අවලංගු කිරීමට සභාපති හා ලේකම් හට හැකි වුව ද එය එසේ නොකර සභාව දැනුවත් කළ බවද දෙවන ටෙන්ඩර්කරු මෙම ටෙන්ඩරය ලබා ගැනීමට අකමැති බව පැවසූ බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් කසළ ටෙන්ඩරයේ දී දෛනික කම්කරු දීමනා වැඩි කරන ලෙස පැවසූ පරිදි පවතින ආර්ථික තත්ත්වය හමුවේ මෙම වැසිකිළි ටෙන්ඩරය පවත්වාගෙන යාමේ අපහසුතා පවතින බැවින් වැසිකිළි ගාස්තු වැඩිකර පිරිසිදුව පවත්වාගෙන යාමට අවස්ථාව සලසා දෙන ලෙස ද තීරණයක් ගන්නේ නම් දෙදෙනාටම එකම තීන්දුවක් ගන්නා ලෙස ද පැවසීය.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් මෙය ගිවිසුම අවලංගු කිරීමක් වන අතර, කසළ ටෙන්ඩරයේ ගිවිසුම් අවලංගු වීමක් සිදු වී නොමැති බවත්, සාධාරණ ඉල්ලීමක් සිදු කරන බවත් විනිවිදභාවයෙන් කටයුතු කළ යුතු නිසා සභාවට මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්, පවසන ලදී.

මේ සම්බන්ධව සෞඛ්‍ය පරිපාලකගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව බස්නැවතුම්පළ හා සතිපොළ පොදු වැසිකිළිය පවිත්‍ර කිරීම හා නඩත්තු කටයුතු සම්බන්ධයෙන් අවවාද කර ලිපියක් අදාල ටෙන්ඩර්කරු වෙත නැවත වරක් අවසාන දැනුවත් කිරීම වශයෙන් ලබා දීමටත්, එසේ අවවාද කිරීමෙන් පසුව ද ගිවිසුම් කඩ කරන්නේ නම් 2022 මැයි 01 දින සිට සභාවට පවරාගෙන නැවත ටෙන්ඩර් කරන තුරු සභාව මඟින් අවශ්‍ය පවිත්‍ර කිරීම හා නඩත්තු කටයුතු සිදු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:14 බළන්ගොඩ ඉරිදා සතිපොළේ සුභ සාධක සමිතියට වෙන් කර ඇති අංක 18 පොළ කඩ කාමරය දීර්ඝ කාලයක් තිස්සේ වසා දමා ඇති අතර, එය බළන්ගොඩ, රාස්සගල පාර, අංක 83/1 ඒ.ඒ.එච්.ඉන්දික අමරසිංහ යන අය වෙත ලබා දීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රුමී මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙම පුද්ගලයා මහජන පොළෙහි කරවල වෙළඳාම් කරන අයෙකු වන අතර, එම ද්‍රව්‍ය තැබීමට ගොස් පොළ ආපනශාලාවෙහි ප්‍රශ්නයක් වූ බව ද එබැවින්

මෙම ස්ථානය ඉල්ලා ඇති බව ද ගැමුණු සුභ සාධක සමිතියට ගාස්තු අය කිරීමකින් තොරව ලබා දී ඇති මෙම කාමරය කාලයක් තිස්සේ වසා දමා ඇති අතර 2020 වර්ෂයෙන් පසුව මේ වන තෙක් ගිවිසුම්ගත වී නොමැති බව ද මෙම ස්ථානය පුද්ගලයෙක් ඉල්ලා සිටින අවස්ථාවේ මාසික ගාස්තු අය කර ගනිමින් ඔහුට ලබා දීමේ අසාධාරණයක් නොමැති බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය පැවසුවේ මෙම කාමරය ලබා දෙන ලෙස තවත් අය ඉල්ලීම් කළ හැකි බවයි.

මෙහි දී පිළිතුරු ලබා දුන් ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා, මේ වන විට මෙම පුද්ගලයා මහජන පොළෙහි කරවල වෙළඳාමෙහි යෙදෙන නමුත් එම ද්‍රව්‍ය තබා ගැනීමට ස්ථානයක් නොමැති නිසා මෙම ඉල්ලීම සිදු කර ඇති බැවින් ඔහුට මෙම කාමරය ලබා දීම සුදුසු බව පවසන ලදී.

ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව අනිකුත් පොළ කඩ කාමර සඳහා අය කරනු ලබන මාසික ගාස්තුව වන රු. 2,000.00 ක මුදල මෙම කඩ කාමරය සඳහා ද අය කර ගනිමින් බළන්ගොඩ ඉරිදා සතිපොළේ සුභ සාධක සමිතියට වෙන් කර ඇති අංක 18 පොළ කඩ කාමරය බළන්ගොඩ, රාස්සගල පාර, අංක 83/1 ඒ, ඒ.එච්. ඉන්දික අමරසිංහ යන අය වෙත ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:15 2021 වර්ෂයේ ජූනි, ජූලි අගෝස්තු සහ සැප්තැම්බර් යන මාසවල කොරෝනා වසංගතය හේතුවෙන් පොදු වැසිකිළි වසා තිබූ අතර, එම කාලයට අදාලව පොදු වැසිකිළි ජල ගාස්තු අය කිරීම සම්බන්ධව තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2021 වර්ෂයේ ජූනි, ජූලි අගෝස්තු සහ සැප්තැම්බර් යන මාසවල කොරෝනා වසංගතය හේතුවෙන් මුළු රටම වසා තිබූ අතර, එම කාලය තුළ බස් රථ ධාවනය සිදු නොවූ බැවින් පොදු වැසිකිළිය ගාස්තු අය කිරීමකින් හා ක්‍රියාත්මක වීමකින් තොරව පැවතුණු බව ද පැවසීය. කෙසේ වෙතත් එම කාලයට අදාලව ජල බිල්පත් 04 ක් ලැබී තිබෙන අතර, එම බිල්පත්වල එකතුව රු.48,001.00 ක් බව ද පොදු වැසිකිළිය වසා තිබූ කාලයේ ලැබුණු ජල බිල්පත් බැවින් මේ සම්බන්ධව සානුකම්පිතව බලා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව 2021 වර්ෂයේ ජූනි, ජූලි අගෝස්තු සහ සැප්තැම්බර් යන මාසවල පොදු වැසිකිළි ජල ගාස්තු වන රු. 48,001.00 ක මුදල අය කිරීමෙන් නිදහස් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:16 2023 වර්ෂයේ බළන්ගොඩ නගර සංවර්ධනය සඳහා අත්පත් කර ගන්නා ලද ඉඩම් කොටස් තුලින් බළන්ගොඩ විකල්ප මාර්ගය අසල ඇති ඉඩම් කොටස සංවර්ධනය කිරීමට අදාල ජලාපවහන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත සභා අනුමැතිය ලබා දීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:17 විවිධ අත්තිකාරම් ගිණුමේ හඳුනා නොගත් රු. 8,680,969.84 ක ශේෂය කපා හැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දැක් වූ ගරු සභාපතිතුමා, විවිධ අත්තිකාරම් ගිණුමේ 2003 වර්ෂයට පෙර සිට පැවත එන රු. 8,680,969.84 ක ශේෂයක් පවතින අතර, මෙම ශේෂය සඳහා වන ලිපි ලේඛන තවදුරටත් නොමැති බැවින් හා 2003 වර්ෂයට පෙර සිට පැවත එන්නක් බැවින් මෙම ශේෂය කපා හැරීම සුදුසු බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:18 2021 වර්ෂයේ දී කැඳවන ලද මිල ගණන් අනුව සභාවේ කර්මාන්ත සඳහා අවශ්‍ය ගල්/වැලි අයිතමයන් සැපයීම දුෂ්කර වී ඇති බව සැපයුම්කරුවන් විසින් දන්වා ඇති බැවින් ඒ සම්බන්ධව තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින්, බළන්ගොඩ නගර සභාවේ කර්මාන්ත සඳහා අවශ්‍ය ගංගා වැලි හා ගල් අයිතම වෙනුවෙන් 2021-12-09 වන දින මිළ ගණන් කැඳ වූ නමුත් රට තුළ වර්තමානයේ උද්ගතව ඇති ඉන්ධන ඇතුළු වෙනත් අමුද්‍රව්‍ය මිල ඉහළ යාම නිසා 2021-12-09 වන දින පැවති මිලට මෙම ද්‍රව්‍ය ලබා දීමට නොහැකි බව අදාල සැපයුම්කරුවන් විසින් දන්වා ඇති බව පැවසීය.

ඒ අනුව නිරන්තරයෙන්ම ඉන්ධන ඇතුළු වෙනත් අමුද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යන බැවින් ගංගා වැලි හා ගල් අයිතම මිල දී ගැනීමේ දී එම අවස්ථාවේ පවතින වෙළඳපොළ මිල ගණන් අනුව මිල දී ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:19 බළන්ගොඩ, කුරගල රජ මහා විහාරයේ පැවැත්වෙන 2022 ජාතික වෙසක් උත්සවය නිමිත්තෙන් බළන්ගොඩ නගරය විදුලි ආලෝකකරණය කිරීම සඳහා 2022 වර්ෂයේ අයවැයෙන් වෙන් කරන ලද රුපියල් ලක්ෂ 10 ක මුදල වියදම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:20 2021 වර්ෂයේ පෙර පාසල් ඇතුලත් කිරීමේ ගාස්තු වශයෙන් රු. 80,000.00 ක මුදලක් අය ගිණුමට බැර කර ඇති අතර, ඉන් රු.40,000.00 ක මුදලක් වර්ෂ අවසාන විවිධ ප්‍රසංගය සඳහා වියදම් දැරීම වෙනුවෙන් අය කර ගෙන ඇති බැවින් එම මුදල ආදායමෙන් ආපසු ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:21 පහත සඳහන් මාර්ග සංවර්ධනයන් සිදු කිරීම සඳහා නම් කර ඇති සමිති වෙත ලබා දීමට සභා අනුමැතිය ලබා ගැනීම

i. පල්ලෙවෙල වෙල අද්දර මාර්ගය සඳහා කොන්ක්‍රීට් පුවරු ඉදි කිරීම (රු. 100,000.00) - සුහසරණ ජ්‍යෝෂ්ඨ පුරවැසි සංගමය
ii. පල්ලෙවෙල තරංග හපුගස්වත්ත මහතාගේ නිවස ඉදිරිපිට කාණුව කොන්ක්‍රීට් තහඩු දමා ආවරණය කිරීම (රු.400,000.00) - සුහසරණ ජ්‍යෝෂ්ඨ පුරවැසි සංගමය
iii. කුමාරගම තුන්වන පටුමග මාර්ගය හා පැති බැම්ම සංවර්ධනය කිරීම (රු. 425,000.00) - අභිමානීගම මරණාධාර සමිතිය
iv. හැටන් නැෂනල් බැංකුව අසලින් දිවෙන මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම (රු.375,000.00) - එකමුතු ජ්‍යෝෂ්ඨ පුරවැසි සංවිධානය

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ටී.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා ප.ව 12.00 ට පමණ සභාවෙන් පිටවන ලදී.**

**07. මන්ත්‍රී යෝජනා**

**07:01 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා**

07:01:01 දහවෙනිදා පමණක් අවුරුදු පොළ පවත්වන්න.

07:01:02 පදික වේදිකාවේ වෙළඳ කටයුතු පොළ තුලට ගන්න

07:01:03 තොග මඩුව සුද්ධ පවිත්‍ර කර විදුලි කාන්දුව සාදන්න

07:01:04 ඉරිදා දිනයේ පොළ තුල තිබූ තරාදිය අදාල ස්ථානයේ ස්ථානගත කරන්න

07:01:05 පසුගිය මාසයේ මුදල් කමිටුව දා ඔබතුමාට දුන් ලිපි දෙක සභාවට ඉදිරිපත් කරන්න.

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් මීට පෙර ගරු සභාපතිතුමා හට ලිපි 02 ක් ලබා දුන් අතර, එය සභාවට ඉදිරිපත් කළේ නැත්තේ ඇයිදැයි නොදන්නා බව ද එම ලිපි දෙක අනුව මෙම යෝජනා ඉදිරිපත් කළ බව ද බළන්ගොඩ ප්‍රාදේශීය සභාව හා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව පොළ පවත්වන දිනයන් අනුව බළන්ගොඩ ඉරිදා පොළ 10 වන දින පමණක් පැවැත්වීම සුදුසු බව ද 11 හා 12 දිනයන්හි පොළ පවත්වන බවට දැන්වීම් ප්‍රචාර ඇති කළහොත් බළන්ගොඩ වෙළඳුන් අසරණ වන බව ද ඒ බව පවසමින් අත්සන් සහිතව ලිපියක් ලබා දී තිබුණු බව ද අවුරුදු ආසන්න වන විට පදික කඩ නිසා වාහන හැසිරවීමේ අපහසුතා මත අනතුරු ඇති විය හැකි බැවින් පොළ තුලට එම වෙළඳ කටයුතු ගන්නා ලෙස ද විදුලිය කාන්දුවීමක් ඇති අතර, එය සොයා බලා සකසන ලෙස ද සත්ත්ව අපද්‍රව්‍ය නිසා අපවිත්‍ර වී ඇති බැවින් තොග මඩුව පිරිසිදු කරන ලෙස ද ඉරිදා දිනයේ පොළ තුල තිබූ තරාදිය වෙළෙන්ඳන් සඳහා ලොකු වාසියක් වූ නමුත් එය අස්ථානගත වී ඇති අතර, එය නැවත ස්ථානගත කරන ලෙස ද පවසන ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් තරාදිය සඳහා බැටරියක් යොදා භාවිතයට ගන්නා බව ද මහජන පොළ 10 වෙනිදා පවත්වන බව ද පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ප.ව 12.25 ට පමණ සභාවෙන් පිටවන ලදී.**

**07:02 ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා**

07:02:01 කිරිඳිගල තැන්නපිටහේන තුඹගොඩ ලිපිනයේ පදිංචි එච්.ජී.එන්. ගුණදාස මහතාගේ අබලන්ව ඇති පදිංචි නිවස අලුත්වැඩියා කර ගැනීම සඳහා රු.50,000.00 ක නිවාස ආධාරයක් ලබා දීම

07:02:02 කුමාරගම වසමේ පදිංචි ජීවනී නිශාන්ගිකා චන්ද්‍රසිරි මහත්මියට වැසිකිළි ආධාරයක් ලබා දීම

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී එම්. ශාන්තිලේඛා මැතිතුමිය ස්ථිර කරන ලදී.

මෙහි දී පළමු යෝජනාව සම්බන්ධයෙන් අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා, එච්.ජී.එන්. ගුණදාස මහතා රැකියාවක් කර ගත නොහැකි තත්ත්වයක සිටින අතර, ගරා වැටුණු කුඩා කටුමැටි නිවසක ජීවත්වන බව ද ඔහුගේ බිරිඳ නිවස සෑදීම සඳහා ඉදි කිරීම් ද්‍රව්‍ය කිහිපයක් සපයා ගෙන ඇති නමුත් එය ප්‍රමාණවත් නොවන බැවින් අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගැනීම සඳහා තමන් හට අයවැය මඟින් වෙන් කර ඇති මුදලින් රු. 50,000.00 ක් ඔහු වෙත ලබා දීම සඳහා යෝජනා කරන බව ද මේ සඳහා තාක්ෂණික නිළධාරී අදාල ස්ථානයට යොමු කර අවශ්‍ය ඇස්තමේන්තුව සකස් කර දෙන ලෙස ද පැවසීය.

එමෙන්ම සභාව සඳහා සංවර්ධන යෝජනා ඉදිරිපත් කරන ලෙස පැවසුව ද පසුගිය අවුරුදු 04 ක කාලයටම මාර්ග දෙකක් පමණක් සංවර්ධනය කර ගැනීමට හැකි වූ බව ද ඉන් එක් මාර්ගයක් කඩා කාපට් කර ඇති අතර, අනිකුත් මාර්ගය කැඩීමට සූදානම් වන අවස්ථාවේ තමන් එයට ඉඩ නොදුන් බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා සංවර්ධන යෝජනා ඉටු නොවන බැවින් මෙම යෝජනා තුන ඉදිරිපත් කරන බව ද කුමාරගම වසමේ පදිංචි ජීවනී නිශාන්ගිකා චන්ද්‍රසිරි මහත්මියගේ නිවස ඉදිරිපිට තිබූ වැසිකිළිය ඉඩම් බෙදී යාමක් නිසා අහිමි වී ඇති අතර, නව වැසිකිළියක් ඉදි කර ගැනීම සඳහා ආර්ථික තත්ත්වයක් නොමැති බැවින් වැසිකිළි ආධාරයක් ලබා දීමට යෝජනා කරන බව ද වැසිකිළිය ඉදි කිරීම සඳහා අවශ්‍ය වැලි ඔවුන් සපයා ගන්නා අතර, වල සකස් කර ගැනීම කර ගන්නා බව ද අනිකුත් ද්‍රව්‍ය සපයා දීමට ඇස්තමේන්තුවක් සකස් කර ගත යුතු බව ද අදාල ඇස්තමේන්තුව අනුව එම ද්‍රව්‍ය ලබා දෙන ලෙස ද පවසන ලදි.

මෙම යෝජනා දෙක සම්බන්ධව වැඩ අධිකාරීතුමාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඊ.ජේ.පේ. ප්‍රේමකුමාර මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා අදහස් දක්වමින් අයවැයට විරුද්ධ වූ ගරු නාගරික මන්ත්‍රීතුමාගේ යෝජනාවලට අයවැයෙන්ම වෙන් වූ ප්‍රතිපාදන ලබා දීම සම්බන්ධව ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී කණ්ඩායම ගැන සතුටට පත්වන බව ද මහජනතාවගේ අවශ්‍යතාවයන්ට තමන් ඇතුළු මන්ත්‍රීවරුන් විරුද්ධ නොවන අතර, අනිකුත් ගරු නාගරික මන්ත්‍රීවරුන් මහජනතාව වෙනුවෙන් යෝජනා ඉදිරිපත් කිරීමේ දී ද ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා පමණක් විරුද්ධ නොවන ලෙස ද ජාතික දේශපාලනය හා නාගරික දේශපාලනය වෙනස් බව ද පවසන ලදී.

ඒ අනුව නීත්‍යානුකූලව සුදුසු පරිදි මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බවට ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:02:03 කුමාරගම අනඳමෙත් ජ්‍යෝෂ්ඨ පුරවැසි සංගමයේ අඩු ආදායම්ලාභී වැඩිහිටියන් 50කට සිංහල හා හින්දු අලුත් අවුරුදු වෙනුවෙන් පරිප්පු හා සීනි 1kg බැගින් ලබා දීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී එම්. ශාන්තිලේඛා මැතිතුමිය ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා, කුමාරගම අනඳමෙත් ජ්‍යෝෂ්ඨ පුරවැසි සංගමය තම කොට්ඨාසයේ ක්‍රියාත්මක සංගමයක් වන අතර, සාමාජිකයන් 140 ක් පමණ සිටින බව ද එම අය අතරින් ඉතාම වයෝවෘද්ධ කිසිදු ආදායමක් නොමැති අය සිටින බව ද එම පුද්ගලයන් සඳහා ආහාර ද්‍රව්‍ය වන සීනි හා පරිප්පු කිලෝ ග්‍රෑම් 01 බැගින් ලබා දීමට යෝජනා කරන බව ද පැවසීය.

මේ සම්බන්ධව ගණකාධිකාරීතුමාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමාගේ යෝජනාව ඉටු කළ නොහැකි නමුත් 2022 අය වැය මඟින් සහන මලු බෙදා දීම වෙනුවෙන් වෙන් වී ඇති ලක්ෂ 06ක ප්‍රතිපාදන යටතේ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමාට වෙන් වන මුදලින් අවශ්‍ය පිරිසට සීනි හා පරිප්පු බෙදීමේ හැකියාව පවතින බව ගරු සභාපතිතුමා පැවසීය.

අනතුරුව 2022 අයවැය මඟින් සහන මලු බෙදා දීම සඳහා වෙන් කරන ලද රුපියල් ලක්ෂ 06 ක මුදලින් එක් ප්‍රතිලාභි පවුලකට උපරිම රුපියල් පන් දහසක වටිනාකමක් බැගින් වන සේ නගර සභා බල ප්‍රදේශයේ ජීවත්වන අඩු ආදායම්ලාභීන් සඳහා සීනි හා පරිප්පු ඇතුළු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදා දීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් සංශෝධිත යෝජනාවක් ලෙස යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03 ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය**

07:03:01 ශෛලතලාරාම මාර්ගයේ කාණු පද්ධතියේ ස්ථාන තුනක ඉදි කිරීම් කර නොමැත. (නන්දන කඩය අසල විහාරස්ථානයේ ජල ටැංකි අසල හා සිරිසේන මහතාගේ නිවස අසල) එය සකස් කර දෙන තෙක් රැඳවුම් මුදල් ලබා නොදීමට අදාල ආයතනය දැනුවත් කිරීම

07:03:02 අනඳමෙත්ගම මාර්ගයේ රෝහිණී මහත්මියගේ නිවෙසට පිවිසෙන ස්ථානයේ පාර මැද සිටුවා ඇති දිරා ගිය විදුලි ලී කණුව පාරේ අයිනක සිටුවීම සඳහා විදුලි බල මණ්ඩලය දැනුවත් කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව කාර්මික නිළධාරීතුමාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**08:01 2022-03-25 දිනැති මුදල් කමිටු වාර්තාව**

01. 2022 අප්‍රේල් මස 24 වන දින සිට ඉදිරි වසරක කාලය සඳහා ZA 9835 ගලි බවුසරය හා ZA 5326 මෝටර් ග්‍රේඩරය රක්ෂණය කිරීමට අදාල මිල ගණන් විවෘත කිරීම.
02. ZA 5039 JCB යන්ත්‍රයේ බ්‍රේක් පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාගැනීම සහ ඒ සඳහා නියෝජිත ආයතනය වන AVONMART ඉන්ජිනියරින් පුද්ගලික සමාගම වෙතින් ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාගැනීම.
03. ළමා උද්‍යානය සඳහා අවශ්‍ය විශේෂිත ආලෝකන සඳහා බලංගොඩ ඉලෙක්ට්‍රික් වෙතින් විදුලි පහන් මිලදී ගැනීම හා අදාල බිල්පත ආවරණ අනුමැතියට යටත්ව අනුමත කර ගැනීම (රු.409,000.00).
04. ආපදා ණය රු.250.000.00 ක මුදලක් හා කාර්යසාධන ණය රු.800.000.00 ක මුදලක් ගෙවීම අනුමත කිරීම.
05. ගිණුම් අංශය සඳහා අවශ්‍ය පරිඝණක හා UPS මිලදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයිම් කමිටුවේ නිර්දේශය ලබා ගැනීම හා නැවත පරිඝණක සඳහා මිල ගණන් කැඳවීමට අනුමත කර ගැනීම.
06. අනඳමෙත්ගම, කිරිදිගල, අංක 33 ඉඩමේ පිහිටි අනතුරුදායක කොස් ගස කපා බිම හෙළීම සඳහා ඉදිරිපත් කරන ලද මිල ගණන් සඳහා අනුමැතිය ලබාගැනීම
07. ගබඩාවේ අවසන්ව ඇති කාර්යාලයට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිලදී ගැනිම සඳහා අනුමැතිය ලබා ගැනීම.
08. ZA 5039 JCB යන්ත්‍රය හදිස්සියේ ගිනි ගැනීමකට ලක්වූ බැවින් එම යන්ත්‍රය පරීක්ෂා කර බලා අලුත් වැඩියා කිරීමට අනුමැතිය ලබා ගැනීම.
09. ක්‍රීඩා පිටිය කුලියට දීම.
10. ඇස්තමේන්තු අනුමත කිරීම

- සරස්වතී වත්ත කාපට් මාර්ගයේ කාණු පිළිසකර කිරීම. - රු.390,000.00
- උඩ ඇල්ලේපොල මල්ලිකාරත්න මහතාගේ හා තවත් නිවාස වලට යන මාර්ගයේ සේදීයන ස්ථාන වැළැක්විමට මාර්ග තලයේ කොන්ක්‍රීට් ඇතිරීම. - රු.340,000.00
- කිවුලේවල පන්සල මාර්ගය සංවර්ධන කිරිම - රු. 190,000.00
- සඳුන්ගම නව නිවාස යෝජනා ක්‍රමය දක්වා යන මාර්ගය සංවර්ධනය කිරිම රු.240,000.00
- සුදර්ශනපුර සැම්සන් මහතාගේ නිවස අසල මාර්ගයසංවර්ධන කිරීම - රු.300,000.00
- හැටන් නැෂනල් බැංකුව අසලින් ආරම්භ වන මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරිම රු.200,000.00
- තිබ්බොටුකැටිය වත්ත මාර්ගය සංවර්ධනය කිරිම -රු. 225,000.00
- සේනක පෙදෙසේ ජල උල්පත මතුවන ස්ථානයේ නිවස පිටුපස පැති බැම්ම ඉදිකිරිම - රු.300,000.00

**08:02 2022-03-30 දිනැති කර්මාන්ත කමිටු වාර්තාව**

i. 2022 අප්‍රේල් මස කර්මාන්ත අංශය මඟින් සිදු කිරීමට අපේක්ෂිත කර්මාන්ත සහ නඩත්තු සඳහා නිර්දේශ ලබා දීම
ii. සංවර්ධන කටයුතු සඳහා ලබා දෙන මන්ත්‍රී යෝජනා වෙනුවෙන් නිර්දේශ ලබා දීම

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද කාරක සභා වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

**2022-03-01 සිට 2022-03-31 දක්වා ආදායම් හා වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 12,194,460.53 |
| වෙනත් ලැබීම් | 12,586,502.97 |
| මුලු ලැබීම් | 24,780,963.50 |
| පුනරාවර්තන වියදම් | 12,845,517.49 |
| වෙනත් වියදම් | 3,751,452.42 |
| මුලු වියදම් | 16,596,969,91 |

**2022-03-01 සිට 2022-03-31 දක්වා ඉන්ධන වාර්තාව**

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 56-1906 | **300.00** |
| 227-5020 | **57,879.94** |
| RD-8240 | **17,404.74** |
| 226-7521 | **7,441.00** |
| BC-0005 | **37,888.00** |
| GC 0001 | **7,091.00** |
| LL - 7688 | **9,881.00** |
| DDR 0008 | **3,659.00** |
| JD-4684 | **3,025.00** |
| ND-5124 | **36,398.92** |
| PF-4006 | **42,943.00** |
| QL-2901 | **5,873.00** |
| RC-1107 | **2,561.00** |
| 37-7933 | **3,716.00** |
| RC 8183 | **28,288.10** |
| RSG 0007 | **12,321.00** |
| SDRR 0013 | **18,983.00** |
| RB 4786 | **28,331.54** |
| RC 1118 | **17,963.00** |
| ZA 5039 | **31,841.00** |
| GK 1483 | **43,593.32** |
| RD 8000 | **15,981.00** |
| SDRR0013 | **19,378.00** |
| CSM 0009 | **181.00** |
| FP 0002 | **102.00** |
| HF 7899 | **801.00** |
| HF 7899 | **9,509.00** |
| HF 7899 | **2,168.00** |
| HF 7899 | **1,224.00** |
| HF 7899 | **3,504.00** |
| HF 7899 | **90,697.00** |
| ZA 0228 | **5,001.00** |
| UQ-1933 | **3,737.00** |
| **එකතුව** | **569,665.56** |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**10. ඇස්තමේන්තු අනුමත කිරීම**

**10.01 ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා**

10:01:01 දෙහිගස්තලාව ක්‍රිස්තියානි පල්ලිය ඉදිරිපිට මාර්ගය හා පැති බැම්ම ඉදි කිරීමේ කර්මාන්තය අභිමානීගම මරණාධාර සමිතියට ලබා දීම හා ඒ සඳහා වන රු. 765,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීම

10:01:02 මුගුණමලේ ගලපල්ලෙඅරාව මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය ශ්‍රම උදාන සුහසාධක සංවිධානයට ලබා දීම හා ඒ සඳහා වන රු. 500,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීම

10:01:03 කිරිඳිගල ජනපද පාර නඩත්තු කිරීම සඳහා වන රු.630,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීම

ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**ගරු නාගරික මන්ත්‍රිනී එම්.ශාන්තිලේඛා මැතිතුමිය ප.ව 1.15 ට පමණ සභාවෙන් පිටවන ලදී.**

## 11. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් සංවර්ධන කටයුතු වෙනුවෙන් 2022 අයවැය මගින් මන්ත්‍රීවරුන් 17 දෙනා සඳහා ලක්ෂ 10 බැගින් ප්‍රතිපාදන වෙන් කළ බවත්, එය වාරික දෙකකින් ලබා දෙන බවත්, වැඩ කරගෙන යාමේ දී 20%ක මුදලක් ලබා දෙන බවත් ගරු සභාපතිතුමන් පැවසූ බව ද ඒ අනුව උඩකන්ද පාර සංවර්ධනය කිරීම සඳහා වන යෝජනාව ලබා දුන් බව ද ඇස්තමේන්තු සකස් කර අදාල කොන්ත්‍රාත්කරු වෙත කර්මාන්තය ඉටු කිරීමට ලබා දුන් පසුව එම කොන්ත්‍රාත්කරු අදාල ද්‍රව්‍ය පවා එම ස්ථානයට ගෙන ගොස් ඇති බව ද පවසන ලදී. නමුත් තමන්ට ලබා දෙන බව පැවසූ මුදල ලබා නොදී විවිධ දේ පවසන බව ද එම මුදල් ලබා දීමේ ගැටලුවක් පවතින්නේ නම් පවසන ලෙස ද මිනිසුන්ට සේවය කිරීමට පැමිණි නමුත් අපහසුතාවයට පත් කරන බව ද වැඩිදුරටත් පැවසීය.

මේ සම්බන්ධව අදහස් දැක් වූ ගරු සභාපතිතුමා, මෙම කර්මාන්තය ඉටු නොවීමට හේතු සොයා බැලූ බව ද ගරු මන්ත්‍රීවරුන් දෙදෙනෙකු මේ සඳහා බලපෑම් කර ඇති බව ද එවැනි දේ සිදු නොකරන ලෙසද තමන් සියලුම දෙනාට එකසේ උදව් කරන අතර, මේ සිද්ධිය සම්බන්ධයෙන් සමාව ඉල්ලා සිටින බව ද කොන්ත්‍රාත්කරු සමඟ මෙම කාර්යය ඉතා ඉක්මනින් ඉටු කරන ලෙස කාර්මික නිළධාරී හට උපදෙස් ලබා දෙන බව ද පවසන ලදී.

ගරු කේ.ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් ව්‍යාපෘතියක් ඉටු කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමට පෙර ඔහු ගැන සොයා බලන ලෙස ද ඇතැම් කොන්ත්‍රාත්කරුවන් ව්‍යාපෘතිය අතරමග නවතා යන බැවින් සියලු දෙනා අපහසුතාවයට පත් වන බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, සියලු මන්ත්‍රීවරුන්ට අසූචි ගා ගත නොහැකි බැවින් අදාල මන්ත්‍රීවරුන්ගේ නම් පවසන ලෙස ඉල්ලා සිටි අවස්ථාවේ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති

මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රිනී පී.චන්ද්‍රලතා මැතිතුමිය එම මන්ත්‍රීවරුන් දෙදෙනා බව ගරු සභාපතිතුමන් පවසන ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී. වීරසිංහ මැතිතුමා පැවසුවේ නම් සඳහන් කිරීම නොකළ යුතුව තිබුණු බවත්, ආණ්ඩුව, අතිගරු ජනාධිපතිවරයා හා ගරු සභාපතිතුමා පත් කරන ලද්දේ අප වන නමුත් කිසිදෙයක් නොලැබුණු බවත් ය.

ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය පිළිතුරු ලබා දෙමින් තමන්ට චෝදනා නොකරන ලෙසත්, ගරු මන්ත්‍රීතුමියට තමන් පැවසුවේ කොන්ත්‍රාත්කරු නිසා තමන්ට සිදු වූ දේ බවත්, එසේ නොමැතිව සල්ලි දෙන්න එපා යැයි නොකී බවත් ය.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් තමන් අද වනතුරු කොන්ත්‍රාත් සිදු කර නොමැති අතර, නුවන් යන තැනැත්තා සමග සම්බන්ධයක් නොමැති බව ද තමන්ගේ නම භාවිත කිරීම සම්බන්ධව ලැජ්ජා වන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමියගේ කර්මාන්තය ඉටු කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමන් විසින් ගත් තීරණය ගැන සතුටු බව ද කර්මාන්ත කමිටුවට හෝ ගරු සභාවට යෝජනා ඉදිරිපත් කිරීමෙන් පසු නව යෝජනා වාර්තාවලට ඇතුලත් විය යුතු නැති බව ද එවැනි යෝජනාවක් කර්මාන්ත කමිටු වාර්තාවට ඇතුලත් වී ඇති බව ද එවැනි දේ සිදු නොකරන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් මුගුණමලේ මාර්ගයේ ඉතිරි වී ඇති නඩත්තු සිදු කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කළ ද ඉටු වී නැති බව ද එවැනි නඩත්තු කිහිපයක් තවත් පවතින බැවින් එම සියලු නඩත්තු හැකි ඉක්මනින් ඉටු කර දෙන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හා අමාත්‍ය චන්ද්‍රා ගන්කන්ද මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කරන බව ද ඇස්තමේන්තු අනුමත කිරීමේ දී කුමාරගම හා දෙහිගස්තලාව කොට්ඨාසයන්හි ඇස්තමේන්තු සකස් කිරීම සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ද සියලුම කොට්ඨාසයන් නියෝජනය වන පරිදි ඇස්තමේන්තු සකස් කරන ලෙස ද බොහෝ කාලයක සිට ලබා දී ඇති නඩත්තු කිහිපයක් තවමත් ඉටු වී නොමැති බව ද ගරු සභාපතිතුමා පත් වී මාස දෙකක් වන නමුදු ෆැමිලියන් මාර්ගය නඩත්තු කර නොමැති අතර, මිනිසුන් නගර සභාවට දොස් නගන බව ද අද රටේ පවතින තත්ත්වය ගැන සැලකීමේ දී සියලුම දෙනා ඇත්ත තේරුම් ගෙන

විසඳුම් සෙවිය යුතු අතර, දේශපාලන වාසි නොගත යුතු බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් තුඹගොඩ මංසන්ධියේ තදබදයක් පවතින බැවින් කහ ඉරක් යොදන ලෙස සභා වාර කිහිපයක දී පැවසුව නමුත් ඉටු නොවූ බවද ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ද ලයිට් කණු ස්ථාන මාරු කිරීමේ දී වැය වන මුදල සභා අරමුදලින් දරනවා ද යන්න දැන ගැනීමට අවශ්‍ය බව ද තමන් විසින් ලයිට් කණු සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීම ඉටු කිරීම පිළිබඳව ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වන බව ද ඇස්තමේන්තු සකස් කිරීමේ දී පසුගිය වාරයේ ඇස්තමේන්තු 23 ම සභා අරමුදලින් සිදු කරන කර්මාන්ත නොවන අතර, මන්ත්‍රීවරුන් සඳහා ලබා දුන් මිලියන 04 සංවර්ධන යෝජනාවන්ට අදාල ඇස්තමේන්තු සභාවෙන් සිදු කළ නිසා එම ඇස්තමේන්තු ඇතුලත්ව ඇති බව ද මුදල් මොනවාද යන්න සටහන් කර තිබුණේ නම් එවැනි ගැටලු ඇති නොවන බව ද ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා රටේ වාතාවරණය සම්බන්ධව දැක් වූ අදහස් අගය කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**12. අවසානය**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් රටේ ජාතික දේශපාලනය හා ගැටලු සම්බන්ධයෙන් අද දින කතා නොකළේ අඩුවෙන් සලකා නොවන අතර, තමන්ට පසුගිය දින දෙකක සිට ධූරයෙන් ඉවත්වන ලෙස දුරකතන ඇමතුම් ලැබෙන බව ද මෙම තනතුර ඕනෑම අවස්ථාවක අත්හැරීමට තමන් සූදානම් බව ද අල්ලා ගැනීමට වඩා අත්හැරීම ඉගෙන ගන්නා බව ද පවුලේ අය නිරන්තරයෙන් බියෙන් සිටින අතර, මෙම දේවල් දරා ගැනීමට අපහසු බව ද තමන් වැඩ කිරීම සඳහා පැමිණි බැවින් කොන්ද කෙළින් තබාගෙන කතා කරන බව ද තම තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍රය කුමක් වුවත් සභාවේ සියලුම මන්ත්‍රීවරුන් සඳහා අවශ්‍ය දේ කිරීමට තමන් බැඳී සිටින බව ද මිලියනයේ වැඩ කටයුතු ඉක්මනින් ඉටු කර ගන්නා ලෙස ද සභාව විසින් ගනු ලබන තීරණ නිළධාරීන් විසින් ක්‍රියාත්මක කරන අතර, ගරු මන්ත්‍රීවරුන් විසින් ලබා දෙන සියලුම යෝජනා ප්‍රායෝගිකව ඉටු කිරීමට අපහසු බැවින් එම තත්ත්වයන් තේරුම් ගන්නා ලෙස ද  පවසන ලදී.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. පී. වීරසිංහ මැතිතුමා විසින් එතුමාගේ ඉල්ලීම් ඉටු නොකළ බවට පැවසූ නමුත් එම ඉල්ලීම් ඉටු කිරීමට නොහැකි මට්ටමේ දේවල් බව ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගමන් බිමන් යාමට වාහනයක් ඉල්ලීම, මුර කුටිය හා සම්පත් පියසට යාබද කාමරය ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම මෙන්ම පුස්තකාල සහායිකා තනතුර වෙනුවෙන් කරන ලද ඉල්ලීම් ආදිය ඉටු කළ නොහැකි බැවින් ලබා නොදුන් අතර, තමා විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරන බව ද කිසිවිටක හොරකම් ජඩකම් සිදු නොකරන බව ද පවුලේ කිසිවෙකු සභාවේ වාහන භාවිත නොකරන බව ද තමන් සභාපතිත්වයට පත් වූ දිනයේ සිටම අභියෝගවලට මුහුණ දෙන බව ද පැවසීය.

තවදුරටත් අදහස් දක්වමින් ගරු සභාපතිතුමා, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා හොරෙක් නොවන බව ද වෙනත් අය විසින් කරන ලද වැරදි සියල්ලටම එතුමාට මුහුණ දීමට සිදුව ඇති බව ද එතුමාට වැඩ කරන්න හැකි වුවත් ඒ සඳහා ඉඩ ලබා නොදී ඇති බව ද දේශපාලන තත්ත්වයෙන් මෙම රට ගොඩ ගැනීමට සියලුම දෙනාට යුතුකමක් හා වගකීමක් පවතින අතර, පක්ෂ භේදයකින් තොරව මිනිසුන් පාරට බැස උද්ඝෝෂණ පවත්වන බව ද පොහොර,තෙල් ඇතුලු ආහාර ද්‍රව්‍ය අඩු මිලට ලබා දීමට හැකි නම්

තමන් පවා පාරට බසින නමුත් එසේ යාමෙන් මිල අඩු කිරීමක් කළ නොහැකි බැවින් උද්ඝෝෂණ මඟ හරිමින් යන බව ද තමන් විශාල වශයෙන් අපහසුතාවයකට හා පීඩනයකට පත්ව ඇති බැවින් තමන්ව තේරුම් ගන්නා ලෙස ද ගරු මන්ත්‍රීවරුන් දෙදෙනෙකුගේ නම් පවසන්නට සිදු වීම පිළිබඳව සමාව ලබා දෙන ලෙස ද නම් පවසන ලෙස කරන ලද ඉල්ලීම අනුව එය සිදු කළ අතර, මීට පෙර සභාවක දී ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්. එන්.පී. වීරසිංහ මැතිතුමා අතර ඇති වූ ගැටලුවේ දීද එම අය වෙනුවෙන් තමන් නිහතමානීව සමාව ගත් බව ද අද නිළධාරීන් සතුටින් තම රාජකාරී කටයුතු සිදු කරන අතර, මහජනතාව වෙනුවෙන් ඉටු කරනු ලබන මෙම සේවාවන් සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින බව ද ජීවන වියදම හමුවේ අසරණ වී ඇතත් ලබන්නා වූ සිංහල හින්දු අලුත් අවුරුද්ද සියලුම දෙනාට සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන බව ද පවසමින් අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනාට ස්තූතිය පළ කරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව.2.20ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.ඒ.වසන්ත ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.